**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 01 ව්‍යාපෘතිය - 2019.**

-------------------------------------------------------------------------------------------------------------

මහ කොළඹ ජලය හා අප ජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 01 ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2013 ජුනි 28 දින එළඹි අංක 2947-එස්.ආර්.අයි සහ අංක 2948- එස්.ආර්.අයි (එස්.එෆ්) දරණ ව්‍යාපෘති ගිවිසුමේ පරිච්ඡේද II හි 2.10(a) වගන්තිය සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය

වැඩසටහනේ ණය ගිවිසුම්වලට අනුව, එවකට ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ ජල සම්පාදන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණු වනුයේ, නාගරික පරිසරය වැඩිදියුණු කිරීම හා මහ කොළඹ ප්‍රදේශයේ නිවැසියන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම වේ. වැඩසටහනේ අරමුණු වනුයේ (අ) කොළඹ නගරයේ ජල සම්පාදන පද්ධතිය පුනරුත්ථාපනය කිරීම සහ පුළුල් කිරීම සහ ආදායම් නොලබන ජලය අඩු කිරීම (ආ) මහ කොළඹ ප්‍රදේශයේ අප ජලය සේවා වැඩිදියුණු කිරීම (ඇ) ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම සහ සේවා සපයන්නන්ගේ ධාරිතාවය වැඩිදියුණු කිරීම (ඈ) ආයෝජන වැඩසටහන කළමනාකරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම වේ. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් කොටස් 12 ක් යටතේ ක්‍රියාත්මක වේ.ණය ගිවිසුම් අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 14,784 කට සමාන එ.ජ.ඩො. මිලියන 112 ක් වන අතර ඉන් රු.මිලියන 11,088 කට සමාන එ.ජ.ඩො. මිලියන 84 ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 3,696 කට සමාන එ.ජ.ඩො. මිලියන 28 ක් සඳහා ශ්‍රී ලංකා රජය විසින් දායක වීමට අපේක්ෂා කරයි. වැඩසටහන එහි කටයුතු 2013 සැප්තැම්බර් 25 දින ආරම්භ කරන ලද අතර, 2016 දෙසැම්බර් 31 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. පසුව, වැඩසටහනේ කාලපරිච්ඡේදය 2020 දෙසැම්බර් 31 දක්වා දෙවරක් දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, වැඩසටහනේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

වැඩසටහන විසින් වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වේද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීමක් උසස් මට්ටමේ සහතිකවීමක් නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව සිදු කරන විගණනයේදී සැමවිටම පවත්නා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් ලබා නොදේ. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල අදාලත්වය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මුල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම .

### 2.1. ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| අනු අංක | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු. මිලියන | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ පැකේජ් 02 මගින් ඉදිරිපත් කරන ලද අන්තර් ගෙවීම බිල්පත්‍ර 18 ට අදාල අත්තිකාරම් මුදල වන රු.මිලියන 95.44ක් හා රඳවාගැනීමේ මුදල් රු.මිලියන 8.1 ක අඩු කිරීම් මුල්‍ය ප්‍රකාශන වලට ගෙන නොමැති නිසා කල වැඩ වටිනාකම රු.මිලියන 103.54කින් අඩුවෙන් දැක්වීම. | 103.54 | ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ අඩුවෙන් දැක්වීම. | මෙම අගයන් වර්ෂය අවසානයේ ගෙවිය යුතු කොන්ත්‍රාත් බිල් වලට අදාළ වේ. විගණනකගේ නිර්දේශයන්ට අනුව වර්ෂ අවසානයට ගෙවිය යුතු බිල් අගයන්ට අදාළ වැඩ පූර්ව අත්තිකාරම් හා රඳවාගැනීමේ අගයන් හඳුනාගෙන ඉදිරියේදී ගිණුම් තැබීමට කටයුතු කරනු ලැබේ. | අඩු පාඩුව නිවැරදි කිරීමට නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ආසියානු සංවර්ධන බැංකුණය බෙදාහැරීමේ අත් පොතේ උප වගන්ති 4.12 ප්‍රකාරව 2019 දෙසැම්බර් 31 දක්වා ණය ලබා දෙන ආයතනය විසින් අයකර ගත් එකතුව වූ එ.ජ.ඩො.3.8 ට සමාන රු.මිලියන 614 ක පොළී හා බැදීම් ගාස්තු ගිණුම් වලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ණය මුදල් ප්‍රමාණය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වීම. | 614 | පිළිවෙලින් ණය ශේෂය, පොළී හා බැදීම් ගාස්තු සමාන අගයකින් අඩුවෙන් දැක්වීම. | අතිරේක සාමාන්‍යාධිකාරි (මුල්‍ය ) උපදෙස් ප්‍රකාරව ව්‍යාපෘතිය විසින් පොළී හා බැදීම් ගාස්තු ගිණුම් තැබීම සිදු නොකරන ලදී. (ම.කො.ජ.අ.ජ.ක.ආ.වැ හි අනෙකුත් විගණන විමසුම් සඳහා දැනටමත් පිළිතුරු ලබා දී ඇත.) කෙසේ වෙතත් පොළී සහ බැදීම් ගාස්තු ව්‍යාපෘති මුල්‍ය ප්‍රකාශන වල සටහන් යටතේ හෙළිදරව් කර ඇත. සටහන් අංක 19. | වසර අවසානයේදී උපයෝජනය වූ ණය ප්‍රමාණය පෙන්වීමට හැකි වන පරිදි ණය ලබා දෙනු ලබන ආයතනය විසින් සෘජුවම අයකර ගන්නා ලද අදාළ පිරිවැය මුල්‍ය ප්‍රකාශන වලට ගෙන ආ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | කොළඹ මහ නගර සභාවට සහ නාගරික සංවර්ධන අධිකාරියට , ඉඩම් හා වාහන ගාල් කිරීමේ ස්ථානය සඳහා ගෙවිය යුතු රු.මිලියන 3.30 ක කුලී මුදල මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොමැත. | 3.30 | ගෙවිය යුතු හා කෙරීගෙන යන වැඩ ගිණුම් අඩුවෙන් දැක්වීම. | මෙම ගෙවීම සම්බන්ධ ලේඛන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර අවසන් වන තෙක් ව්‍යාපෘතිය වෙත නොලැබුණි. එම නිසා ගෙවිය යුතු වියදම් ලෙස මෙම බිල් ගිණුම් ගත නොකරන ලදී. ඒ වගේම නිශ්චිත මූල්‍ය වගකීම තක්සේරු කිරීම සඳහා ව්‍යාපෘතියේ කිසිදු ලිඛිත ගිවිසුමක් නොවිය. | සමාලෝචිත වර්ෂය තුල ගෙවිය යුතු නිවැරදි ප්‍රමාණය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වෙත ගෙන ඒමට පියවර ගත යුතුය. |
| (ඈ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ (ඩීආර්එම්එස් 814) වාර්තාවට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සෘජු ගෙවීම් හා ප්‍රතිපූර්ණ වටිනාකම රු.මිලියන 1,905.27 කි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට අනුව එය රු.මිලියන 1,908.8 ක් ලෙසට පෙන්වා ඇත. එබැවින් ශේෂ දෙක අතර රු.මිලියන 2.81 ක වෙනසක් නිරීක්ෂණය විය.<br>මෙම වෙනස සැසඳීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | 2.81 | සෘජු ගෙවීම් වැඩිපුර දැක්වීම. | ව්‍යාපෘතියේ සෘජු ගෙවීම් විදේශ සම්පත් දෙපාර්තමේන්තු වාර්තාව (814-වාර්තාව) පදනම් කරගෙන යාවත්කාලීන කෙරේ. කෙසේ වෙතත් විශේෂයෙන් වර්ෂ අවසාන යාවත්කාලීන වීම්, සඳහා සැලකිය යුතු කාල පරතරයක් ඇති වේ. මෙම වර්ෂයේදීත් 814 වාර්තාව ලබා ගැනීමට හැකිවුයේ 2020 පෙබරවාරි අවසානයේදීය. ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීම සඳහා එවැනි කාලයක් බලා සිටිය නොහැකි නිසා වසර අවසාන ඩොලර් ගණුදෙනු, වසර අවසානයේ විනිමය අනුපාතිකයමත පදනම්ව යාවත්කාලීන කරන ලදී.<br>අනුපාත විචලනය හේතුවෙන් ඇතිවන අඩු හෝ වැඩි ගැලපීම් 814 වාර්තාවේ වාර්තා වී ඇති සත්‍ය ප්‍රමාණයන් සැලකිල්ලට ගෙන ඊලග වර්ෂයේදී ගිණුම් වලට ගනු ලැබේ.<br>මෙහි සඳහන් වෙනස විගණකවරු විසින් සොයා ගෙන ඇත්තේ ඒ නිසාය. විදේශ සම්පත් දෙපාර්තමේන්තු 814 වාර්තාව කඩිනමින් නිකුත් නොකරන්නේ නම් ව්‍යාපෘතියට එවැනි ගැලපීම් වලක්වා ගත නොහැකිය. | සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුල ප්‍රතිපූර්ණයන් හා සෘජු ගෙවීම් විදේශ සම්පත් දෙපාර්තමේන්තු 814 වාර්තාව සමග සැසදිය යුතු අතර ඒ අනුව ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන නිවැරදි කල යුතුය. |
| (ඉ) | සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුල එකතුව රු.මිලියන 145.97 ක් වූ උප ණය ගිවිසුම මත වූ පොලිය, රඳවා ගැනීමේ බදු, ජාතිය ගොඩ නැගීමේ, වැටුප් සහ ද්‍රව්‍ය හුවමාරු අගයන් මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි. | 145 | කල වැඩ වටිනාකම අඩුවෙන් දැක්වේ. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල ලෙජරය හා ව්‍යාපෘති මෙහෙයුම් ඒකකයෙහි පොත් අතර කල වැඩ වටිනාකම වෙනස්වීම් සංසන්දනය කර, දැනටමත් විගණක වරුන් වෙත ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල කෙටුම්පත් විගණන වාර්තාව සමග භාර දී ඇත. | සංසන්දනයෙන් පසුව අදාළ වෙනස්කම් මූල්‍ය ජ්‍රකාශනවල ගැලපිය යුතුය. |

එහි ප්‍රතිපලයක් ලෙස ඒ හා සමාන අගයකින් ව්‍යාපෘතිය තුල කල වැඩ වටිනාකම අඩුවෙන් දක්වනු ලැබේ.

**3. භෞතික කාර්ය සාධනය.**

**3.1. භෞතික ප්‍රගතිය.**

<table>
<tr><th>අනු අංක</th><th>ක්‍රියාකාරකම්</th><th>ඒකකයන්</th><th>අපේක්ෂිත ඉලක්ක</th><th>2019 දෙසැම්බර් 31 දිනට ඉලක්ක ලගාකර ගැනීම්.</th><th>බලපෑම්</th><th>කළමනාකරණයේ අදහස් දැක්වීම්</th><th>විගණකගේ නිර්දේශයන්</th></tr>
<tr><td>----</td><td>-----------------</td><td>-----------</td><td>----------</td><td>----------</td><td>---------------</td><td>------------------------------------</td><td>------------</td></tr>
<tr><td>(අ)</td><td>කොළඹ නගරයේ උතුරු කොටසේ ආදායම් නොවන ජලය අඩු කිරීම සදහා වන පද්ධති පුනරුත්ථාපනය.</td><td></td><td></td><td></td><td rowspan="5">ඉදිකිරීම් ප්‍රමාද වීම සහ නියමිත කොන්ත්‍රාත් කාලය තුල කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමට නොහැකිවීම. එහි ප්‍රතිපලයක් ලෙස, කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය අඩුකිරීමේ අපේක්ෂිත සියයට 18 ක් වු ඉලක්කයට ලගා වීමට නොහැකි වී ඇත.</td><td rowspan="5">1)අප පහත සදහන් තොරතුරු 2020 සැප්තැම්බර් 30 දිනට ඉදිරිපත් කරමු.
<table>
<tr><th>ප්‍රදේශය</th><th>ආරම්භය</th><th>නිම කිරීමට සැලසුම් කල දිනය</th><th>දි.මි.ප්‍ර සම්පූර්ණ කිරීම් හා මෙහෙයුම් හා නඩත්තු අංශයට භාරදීම</th></tr>
<tr><td>උතුර</td><td>2015 ජනවාරි</td><td>2020 දෙසැම්බර්</td><td>5</td></tr>
</table>
<table>
<tr><th>දි.මි.ප්‍ර සම්පූර්ණ කළ (ආදායම් නොව</th><th>නිම කිරීමට ආසන්න දි.මි.ප්‍ර</th><th>සම්පූර්ණ කල නල එළීම් කි.මී</th><th>සම්පූර්ණ කල නිවාස සම්බන්ධතා ලබා දීම</th></tr>
</table>
</td><td rowspan="5">සැලසුම් කල කොන්ත්‍රාත් කාලය තුල වැඩ කඩිනම් කිරීමට සහ ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් කොන්ත්‍රාත් කටයුතු සමීපව අධීක්ෂණය කිරීමට පියවර ගත යුතුය.</td></tr>
<tr><td></td><td>• නල ඇතිරීම්.</td><td>මීටර්</td><td>205,017</td><td>191,928</td></tr>
<tr><td></td><td>• සම්බන්ධතා මාරු කිරීම්.</td><td>නිවාස හිමියන්</td><td>37,173</td><td>15,518</td></tr>
<tr><td></td><td>• සම්පූර්ණ කරන ලද දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ.</td><td>ඒකක</td><td>16</td><td>05</td></tr>
<tr><td></td><td>• සමස්ථ කොන්ත්‍රාත් කාර්ය සාධනය</td><td>ප්‍රතිශතය</td><td>97.75</td><td>82.36</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| න ජලය ගණන ය කිරීම ක්‍රියාත් මක වන) | | | |
| 8 | 3 | 205 | 31,714 |

කෙසේ වෙතත් ආදායම් නොවන ජලයෙහි අගය ක්‍රමයෙන් සියයට 39 වඩා අඩුවෙමින් පවතින අතර සම්පූර්ණ කර ඇති දි.මී.ප්‍ර. ආදායම් නොවන ජලයෙහි සාමාන්‍ය අගය මේ වන විට සියයට 15.2 ක් වේ. 2020 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ ඉලක්ක සපුරාලීමට ඉතිරි දි.මී.ප්‍ර සම්පූර්ණ කර භාර දීමට කටයුතු සුදානම් කර ඇත.

<table>
<tr><td>(ආ)</td><td>කොළඹ නගරයේ නැගෙනහිර කොටසෙහි ආදායම් නොවන ජලය අඩු කිරීම සඳහා වන පද්ධති පුනරුත්ථාපනය.<br>• නල ඇතිරීම.<br>• සම්බන්ධතා මාරු කිරීම.<br>• සම්පූර්ණයෙන් නිම කල දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ.<br>• සමස්ථ කොන්ත්‍රාත් කාර්ය සාධනය.</td><td>මීටර්<br>නිවාස හිමියන්<br>ඒකක<br>ප්‍රතිශතය</td><td>237,083<br>25,256<br>20<br>78.44</td><td>161,558<br>1,098<br>03<br>68.15</td><td>ඉදිකිරීම් ප්‍රමාද වීම සහ නියමිත කොන්ත්‍රාත් කාලය තුල කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමට නොහැකිවීම හා එහි ප්‍රතිපලයක් ලෙස කොළඹ නගරයේ ආදායම් නොවන ජලය අඩුකිරීමේ අපේක්ෂිත සියයට 18 ක් වූ ඉලක්කයට ලගා වීමට නොහැකි වී ඇත.</td><td>අප විසින් පහත සඳහන් තොරතුරු 2020 සැප්තැම්බර් 30 දිනට ඉදිරිපත් කරමු.<br><table>
<tr><th>ප්‍රදේශය</th><th>ආරම්භය</th><th>නිම කිරීමට සැලසුම් කල දිනය</th><th>සම්පූර්ණ කල හා මෙ.හා.න. අංශයට භාරදුන්</th></tr>
<tr><td>නැගෙනහිර</td><td>2015 ජූලි</td><td>2021 ජූනි</td><td>4</td></tr>
</table><br><table>
<tr><th>සම්පූර්ණ කල දි.නි.ප්‍ර. (කෙරීගෙන යන )</th><th>සම්පූර්ණ කිරීමට ආසන්න දි.මි.ප්‍ර</th><th>සම්පූර්ණ කල නල ඇතිරීම</th><th>සම්පූර්ණ කල නිවාස සම්බන්ධතා</th></tr>
<tr><td>7</td><td>4</td><td>212</td><td>27,464</td></tr>
</table><br>කෙසේ වෙතත්, ආ.නො.ජ අගය ක්‍රමයෙන් සියයට 39 වඩා අඩුවෙමින් පවතින අතර සම්පූර්ණ කර ඇති දි.මි.ප්‍ර සඳහා සාමාන්‍ය අගය මේවන විට සියයට 15.2 ක් වේ. 2021 වර්ෂය මැද වන විට ඉතිරි දි.මි.ප්‍ර සම්පූර්ණ කර භාර දීමට කටයුතු සුදානම් කර ඇත.</td><td>ව්‍යාපෘති අධ්‍යක්ෂණ ඒකකය විසින් සැලසුම් කල කොන්ත්‍රාත් කාලය තුල වැඩ කඩිනම් කිරීමට සහ ව්‍යාපෘති කොන්ත්‍රාත් කටයුතු සමීපව අධීක්ෂණය කිරීමට පියවර ගත යුතුය.</td></tr>
<tr><td>(ඇ)</td><td>මාලිගාකන්ද ආදායම් නොවන ජලය සඳහා වන ගොඩනැගිල්ල ඉදිකිරිම.</td><td>ප්‍රතිශතය</td><td>100</td><td>81.38</td><td>ආ.නො.ජ සඳහා වන ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීම ප්‍රමාද වීම.</td><td>ව්‍යාපෘතියට සම්පත් යෙදවීම වැඩිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු උනන්දු කරවීමට පියවර කිහිපයක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය විසින් ගන්නා ලදී.<br><br>ව්‍යාපෘති අධ්‍යක්ෂණ ඒකකය තුල කොන්ත්‍රාත්කාර සමාගමේ සභාපති (ප්‍ර.වි.නි) හා ප්‍රධාන කාර්ය</td><td>ව්‍යාපෘති කාර්යයන්හි ප්‍රගතිය සමීපව අධීක්ෂණය කල යුතුය.</td></tr>
</table>

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | මණ්ඩලය සමග රැස්වීම කිහිපයක් පවත්වන ලදී. විශේෂයෙන් 2020 ජුනි 15 වන දින ජ.ස.ජ.ප්‍ර.ම. ප්‍රධාන කාර්යාලයේදී ජ.ස.ජ.ප්‍ර.ම. සාමන්‍යාධිකාරීගේ ප්‍රධානත්වයෙන් සහ 2020 සැප්තැම්බර් 07 වන දින ජ.ස.ජ.ප්‍ර.ම. සභාපතිගේ ප්‍රධානත්වයෙන් මාලිගාකන්ද වැඩ බිමේ මෙම රැස්වීම් පවත්වන ලදී.<br>ඉහත රැස්වීම් වල ප්‍රතිඵල ලෙස බොහෝ කාර්යයන් (සිවිලිම් කාර්යයන්, කොටස් කිරීමේ කාර්යයන්,වායු සමීකරණ කාර්යයන් ගිණි නිවීමේ උපකරණ ස්ථාපනය කිරීමේ කාර්යයන්) කඩිනම් වී ඇත.<br>සාකච්චා තීරණයන්ට අනුව, ආදායම් නොවන ජලය සඳහා ගොඩනැගිල්ලේ කාර්යයන් වලට අදාළ ගෙවීම් සෘජුවම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් කළමනාකරණය කිරීමට එස්ක්‍රෝ ගිණුමක් ලින්ක් ඉංජිනේරු ආයතනය මගින් විවෘත කරන ලදී. | |
| (ඇ) | කාන්දුවීම් හඳුනා ගැනීමේ හා එයට අදාල අනෙකුත් සියලු උපකරණ සැපයීම හා ස්ථාපනය කිරීම. | කොන්ත්‍රාත්තුව සාමුහිකව අවසන් කරන ලදී.මෙම කොන්ත්‍රාත්තුව යටතේ දේශීය මිලදී ගැනීම් සම්පූර්ණ කර ඇතත්, විදේශීය මිලදී ගැනීම් සඳහා නව කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර ඇත්තේ 2020 ජුනි 10 වන දිනය. | කාන්දු වීම් හඳුනා ගැනීමේ උපකරණ සැපයීම ප්‍රමාද වීම | පෙර කොන්ත්‍රාත්තුවේ විදේශීය කොටස හා සම්බන්ධ ආදායම් නොවන ජලය සඳහා වූ උපකරණ මිලදී ගැනීම සඳහා , නව ටෙන්ඩරයක් 2018.05.23 දින කැඳවන ලදී. කෙසේ වෙතත් ලංසුකරුවන්ගේ තාක්ෂණික සුදුසුකම් නොමැති කම හේතුවෙන් , ටෙන්ඩරය 2019.04.03 දින නැවත කැඳවන ලද අතර, අවසානයේදී එය 2020.06.10 දින ජීසීඩබ්ඩබ්එම්අයිඅයිපී/ඒඩීඑම්/ඉක්‍යුයුඅයිපී/අයිසීබී/07 කොන්ත්‍රාත් අංකය යටතේ ප්‍රදානය කරන ලදී. | කාර්යයන්හි ප්‍රගතිය සමීපව අධීක්ෂණය කිරීම. |

## 3.2. කොන්ත්‍රාත් කළමනාකරණය

**අනු අංක:** (අ)

**විගණන නිරීක්ෂණය**

කොලඹ නගරයේ උතුරු කොටසේ ආදායම් නොවන ජලය අඩු කිරීම සඳහා වන පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුව 2014 දී ප්‍රදානය කරන ලද අතර එය 2018 ජුලි මාසයේදී නිමකිරීමට සැලසුම් කර ඇත.පසුව, කොන්ත්‍රාත් කාලය 2020 පෙබරවාරි දක්වා දීර්ඝ කර තිබුණි. මීටර 205,017 ක නල ඇතිරීමේ කාර්යයන් නිම කිරීමට සැලසුම් කර ඇති අතර දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 16ක නිවාස 37,173 ක සේවා සැපයීම් මාරු කිරීම් ලබා දීමට නියමිතය.

කෙසේ වෙනත්, 2019 දෙසැම්බර් 31 දින වන විට නල ඇතිරීම් කාර්යයන් මීටර් 191,928 ක් අවසන් කර ඇති අතර සේවා සැපයීම් මාරු කිරීම් ලබා දීමට හැකි වී තිබුනේ පවුල් 15,558 කට පමණි.

2020 ජුනි 30 වන විට එය මීටර් 201,206 ක නල ඇතිරීම් හා නිවාස හිමියන් සඳහා සේවා සැපයීම් මාරු කිරීම් 19,508 ක් වී ඇත.

කෙසේ වෙතත් 2019 දෙසැම්බර් 31 වන විට ආදායම් නොලබන ජලය කළමනාකරණය සඳහා දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 16 න් 05ක් පමණක් සම්පූර්ණ කර භාර දී ඇත.

**බලපෑම්**

වැඩසටහනේ අරමුණු ප්‍රකාරව කොළඹ නගරය තුල ආදායම් නොවන ජලය අඩු කිරීම ප්‍රමාද වීම.

**කළමනාකරණයේ අදහස් දැක්වීම**

2020 සැප්තැම්බර් 30 දිනට අප විසින් පහත තොරතුරු ඉදිරිපත් කරමු.

| ප්‍රදේශය | ආරම්භය | නිම කිරීමට සැලසුම් කල දිනය | දි.මී.ප්‍ර සම්පූර්ණ කර මෙ හා න අංශයට භාරදීම |
|---|---|---|---|
| උතුර | ජනවාරි 2019 | දෙසැ 2020 | 5 |

| දි.මී.ප්‍ර සම්පූර්ණකර (ආ.නො.ජ ක්‍රියාත්මක වීම) | සම්පූර්ණ කිරීමට ආසන්න දි.මී.ප්‍ර | සම්පූර්ණ කල නල ඇතිරීම් මිටර් (කි.මී) | සම්පූර්ණකල නිවාස සම්බන්ධතා මාරුකිරීම් |
|---|---|---|---|
| 8 | 3 | 205 | 31,714 |

කෙසේ වෙතත් ආදායම් නොවන ජලයෙහි අගය ක්‍රමයෙන් සියයට 39ට වඩා

**විගණකගේ නිර්දේශයන්**

සැලසුම් කල කොන්ත්‍රාත් කාලය තුල වැඩ කඩිනම් කිරීමට සහ ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් කොන්ත්‍රාත් කටයුතු සමීපව අධික්ෂණය කිරීමට පියවර ගත යුතුය.

අඩුවෙමින් පවතින අතර, මේ දක්වා සම්පූර්ණ කරන ලද දිස්ත්‍රික් මීනුම් ප්‍රදේශ වල වල ආදායම් නොවන ජලයෙහි අගය සියයට 15.2ක සාමාන්‍යයක් වේ.
ව්‍යාපෘතියේ ඉලක්ක සපුරා ගැනීම සඳහා 2020 වසර අවසාන වන විට ඉතිරි දි.මී.ප්‍ර සම්පූර්ණ කර භාර දීමට කටයුතු සූදානම් කර ඇත.

(ආ) කොළඹ නගරයේ නැගෙනහිර කොටසෙහි ආදායම් නොවන ජලය අඩු කිරීම සඳහා වූ පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුව යටතේ 2020 ඔක්තෝම්බර් 01 වන විට නල එළීමේ කාර්යයන් මීටර් 237,083 සම්පූර්ණ කර නිවැසියන් 25,256 කට සේවා සම්බන්ධතා මාරු කිරීම් සිදුකිරීම අපේක්ෂිත ඉලක්කයන් විය.
කෙසේ වෙතත්, 2019 දෙසැම්බර් වන විට දිස්ත්‍රික් මීනුම් ප්‍රදේශ 20ක නිවාස 1,098 ක් සඳහා නල එළීම් කටයුතු මීටර් 161,558 ක් පමණක් අවසන් කර ඇති අතර, 2020 ජුලි මස වන විට මීටර් 200,008ක නල එළීමේ කටයුතු සහ නිවැසියන් 4030 දෙනෙකු සඳහා සේවා සම්බන්ධතා මාරු කර දීම් අවසන් කර තිබුණි.
කෙසේ වෙතත්, 2019 දෙසැම්බර් 31 දින වන විට ,ආදායම් නොලබන ජලය අඩු කිරීම කළමනාකරණය සම්බන්ධයෙන් දිස්ත්‍රික්ක මීනුම් ප්‍රදේශ 20න් 03ක් පමණක් සම්පූර්ණයෙන් නිමකර භාරදී තිබුණි.

වැඩ සටහනේ පරමාර්ථයට අනුව කොළඹ නගර ප්‍රදේශයේ ආදායම් නොවන ජලය අඩු කිරීම ප්‍රමාද වීම.

2020 සැප්තැම්බර් 30 දිනට අප විසින් පහත තොරතුරු ඉදිරිපත් කරන්නෙමු.

| ප්‍රදේශය | ආරම්භය | නිම කිරීමට සැලසුම් කල දිනය | දි.මී.ප්‍ර සම්පූර්ණ කර මෙ භාන භාර දී ඇති |
|---|---|---|---|
| නැගෙනහිර | 2015 ජුලි | 2021 ජුනි | 4 |

| දි.මී.ප්‍ර සම්පූර්ණ කර ආ.නො.ජලය ක්‍රියාත්මක වීම | සම්පූර්ණ කිරීමට ආසන්න දි.මී.ප්‍ර | සම්පූර්ණ කල නල ඇතිරීම් කි.මී | සම්පූර්ණ කල නිවාස සම්බන්ධතා මාරුකිරීම් |
|---|---|---|---|
| 7 | 4 | 212 | 27,464 |

කෙසේ වෙතත් ආදායම් නොවන ජලයෙහි අගය ක්‍රමයෙන් සියයට 39 ට වඩා අඩුවෙමින් පවතින බව නිරීක්ෂණය වන අතර මේ දක්වා සම්පූර්ණ කරන ලද දිස්ත්‍රික් මීනුම් ප්‍රදේශවල වල ආදායම් නොවන ජලයෙහි අගය සියයට 15.2ක සාමාන්‍යක් වේ.

සැලසුම්කර ඇති කොන්ත්‍රාත් කාලය තුල වැඩ කඩිනම් කිරීමට සහ ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් කොන්ත්‍රාත් කටයුතු සමීපව අධීක්ෂණය කිරීමට පියවර ගත යුතුය.

| | | | | |
|---|---|---|---|---|
| | | | ව්‍යාපෘතියේ ඉලක්ක සපුරා ගැනීම සඳහා 2021 වසර මැද භාගය වන විට ඉතිරි දිස්ත්‍රික්ක මීනුම් ප්‍රදේශ සම්පූර්ණ කර භාර දීමට කටයුතු සුදානම් කර ඇත. | |
| (ඇ) | කාන්දුවීම් හඳුනා ගැනීමේ සහ එයට අදාල අනෙකුත් සියලුම උපකරණ සැපයීම හා ස්ථාපනය සඳහා වන කොන්ත්‍රාත්තුව 2014 මැයි 29 දින විදේශීය සමාගමකට රු.මි 24.37 කට ප්‍රදානය කර ඇති අතර එය දෙපාර්ශවයේ එකඟතාවයෙන් අවසන් කර ඇත.<br>එසේ වුවත් , මෙම කොන්ත්‍රාත්තුවේ දේශීය කොටස යටතේ මිලදී ගත යුතු උපකරණ දේශීය නියෝජිතයා විසින් රු.මිලියන 10.62 කට සපයා තිබුණ මුත්, 2019 දෙසැම්බර් 31 වන විටත් මෙම කොන්ත්‍රාත්තුව යටතේ විදේශීය රට වලින් සිදු කළ යුතු ප්‍රසම්පාදනයන් අවසන් කර නොමැත. | කාන්දුවීම් හඳුනා ගැනීමේ උපකරණ සැපයීම ප්‍රමාද වීම. | පෙර කොන්ත්‍රාත්තුවේ විදේශීය කොටස හා සම්බන්ධ ආදායම් නොවන ජලය සඳහා වූ උපකරණ මිලදී ගැනීම සඳහා නව ටෙන්ඩරයක් 2018.05.23 දින කැඳවන ලදී. කෙසේ වෙතත් ලංසු කරුවන්ගේ තාක්ෂණික සුදුසුකම් නොමැති කම හේතුවෙන්, ටෙන්ඩරය 2019.04.03 දින නැවත කැඳවන ලද අතර අවසානයේ එය 2019.06.10 දින ජීසීඩබ්ඩබ්එම්අයිඅයිපී/ඒඩීබී/ඊකිව්යුඅයිපී/ අයිසීබී/07 ආර් කොන්ත්‍රාත් අංකය යටතේ ප්‍රදානය කරන ලදී. | කොන්ත්‍රාත් කටයුතු සමීපව අධීක්ෂණය කළ යුතුය. |
| (ඇ) | ආදායම් නොවන ජලය සඳහා මාලිගකන්දෙහි මහල් 06 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 344.25ක වටිනාකමට 2017 මාර්තු 23 වන දින කොන්ත්‍රාත්කරු වෙත ප්‍රදානය කර තිබුණු අතර, කොන්ත්‍රාත්කරු විසින් 2017 අප්‍රේල් 24 වන දින ඉදිකිරීම් කටයුතු ආරම්භකර තිබූ අතර 2018 ඔක්තෝම්බර් 23 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි . වැඩ වල ප්‍රගතිය මන්දගාමී වීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දින දක්වා අවස්ථා තුනකදී කොන්ත්‍රාත්තුව දීර්ඝ කර තිබුණි.<br>භෞතික කාර්ය සාධන වාර්තා වලට අනුව , 2019 දෙසැම්බර් 31 වන විට අපේක්ෂිත සියයට 100 ක ප්‍රගතියට සාපේක්ෂව කොන්ත්‍රාත්තුවේ සමස්ත භෞතික ප්‍රගතිය සියයට 81.38 ක් ලෙස පැවති අතර , 2020 මැයි 31 වන විට | ආදායම් නොවන ජලය සඳහා වන ගොඩනැගිල්ල ඉදිකිරීම් ප්‍රමාදය | ව්‍යාපෘතියට සම්පත් යෙදවීම වැඩිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු උනන්දු කරවීමට පියවර කිහිපයක් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය විසින් ගන්න ලදී.<br>ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය හිදී කොන්ත්‍රාත්කාර සමාගමේ සභාපති හා ප්‍රධාන කාර්ය මණ්ඩලය සමග රැස්වීම් කිහිපයක් පවත්වන ලදී. විශේෂයෙන් 2020 ජුනි 15 වන දින ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල ප්‍රධාන කාර්යාලයේදී, ජ.ස.ජ.ප්‍ර.ම. සාමාන්‍යාධිකාරීගේ ප්‍රධානත්වයෙන් සහ , 2020 සැප්තැම්බර් මස 07 වන දින | ප්‍රමුඛතා කටයුතු ඉස්මතු කරමින් , මෙන්ම කාර්යයන් සම්පූර්ණ කිරීම් සඳහා සතිපතා, කාර්තුමය වශයෙන් භෞතික ඉලක්ක නියම කරමින් ඉතිරි කොන්ත්‍රාත් කාලය සඳහා කෙටිකාලින ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කිරීම හා එහි කාර්ය සාධනය |

| | | | | |
|---|---|---|---|---|
| | එය සියයට 82.36ක් විය. තවද 2020 අගෝස්තු 19 වන දින සිදුකරන ලද භෞතික පරීක්ෂණ අවස්ථාවේදී වායු සමීකරණ ස්ථාපිත කිරීම , කොටස් වෙන් කිරීමේ වැඩ , සිවිලිම් හා විදුලි වැඩ ජල නල වැඩ සහ පින්තාරු කටයුතු යනාදිය සම්පූර්ණ කර නොමැති බවට නිරීක්ෂණය විය. | | ජ.ස.ජ.ප්‍ර.ම. සභාපතිගේ ප්‍රධානත්වයෙන් මාලිගාකන්ද වැඩ බිමෙහිද රැස්වීම් පවත්වන ලදී.<br>ඉහත රැස්වීම් වල ප්‍රතිඵල ලෙස බොහෝ කාර්යයන් (සිවිලිම් කාර්යයන්, කොටස් වෙන්කිරීම් කාර්යයන්,වායු සමීකරණ කාර්යයන් ගිණි නිවීමේ උපකරණ ස්ථාපනය කිරීමේ කාර්යයන්) කඩිනම් වී ඇත.<br>සාකච්චා තීරණයන්ට අනුව, ආදායම් නොවන ජලය සඳහා වන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් වලට අදාලව ගෙවීම් යොමු කර ඇති බව සහතික වීම ජ.ස.ජ.ප්‍ර.ම. මඟින් කළමනාකරණය කිරීමට එස්ක්‍රෝ ගිණුමක් ලින්ක් ඉංජිනේරු ආයතනය මගින් විවෘත කරන ලදී.<br>තවද, කොටස් කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය, ගිණි ආරක්ෂක පද්ධතිය සහ සනීපාරක්ෂක උපාංග ලැබී ඇති අතර එම කටයුතු සිදුවෙමින් පවතී. | සමීපව නිරීක්ෂණය කිරීම. |
| (ඉ) | එලි හවුස් හි ඉදිකරන ලද මහල් තුනක ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල ගොඩනැගිල්ල 2019 මැයි 02 දින ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලයට භාර දී තිබුන මුත් 2020 අගෝස්තු මස 19 වන දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී ඉහල ස්ලැබ් එකෙන් , සමහර ජනෙල් වලින් සහ ප්‍රධාන පඩිපෙලෙහි ස්ථිර විදුරු ආවරණ වලින් වැසි ජලය කාන්දු වීම, දොර ජනෙල් උපාංග හානි වීම්, දෙවන මහලෙහි වැසි ආවරණය බිම් මහලෙහි පින්තාරු කාර්යයන් හා ටයිල් ඇතිරීමේ කාර්යයන් වල අඩුපාඩු නිරීක්ෂණය විය. | අඩු පාඩු හඳුනාගෙන හා නිසිලෙස නිවැරදිකර නොමැත. | මෙම ගොඩනැගිල්ල සඳහා, අනාගතයේදී අමතර මහල් 2ක් එකතු කිරීමට ඇති හෙයින් ජීසීඩබ්ඩබ්එම්අයිඅයිපී සැලසුම් අංශයේ නිර්දේශ ප්‍රකාරව ඉහල මහල හරහා වන ඕනෑම කාන්දු වීමක් අවම කිරීමට ස්ලැබ් වහලයේ ජල ආරක්ෂණය සිදු කරන ලදී.<br>හඳුනාගත් සුළු කාන්දුවීම් කොන්ත්‍රාත්කරු විසින් දැනටමත් නිවැරදිකර ඇත. | අඩු පාඩු දෝෂයන් නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |

කෙසේ වෙතත් දෝෂ වගකීම් කාල සීමාව තුල එම අඩුපාඩු හඳුනා ගැනීමට සහ එම අඩුපාඩු නිවැරදි කිරීමට ව්‍යාපෘතිය අපොහොසත් වී ඇත.

වහලයේ ස්ලැබ් එකේ ජල කාන්දුව හේතුවෙන් ස්ලැබ් සොෆිට් සහ යාබද බිත්ති වල තෙත පැල්ලම් දක්නට ලැබුණි . ඉංජිනේරු සහකාර කාමරයේ දක්නට ලැබූ ඉහත එකිනෙකට සම්බන්ධ දෝෂ කොන්ත්‍රාත්කරු විසින් නිවැරදි කරන ලදී. තවද මෙම ජල ආරක්ෂණ කටයුතු සඳහා කොන්ත්‍රාත් ගත වගකීම් කාලය 2018 දෙසැම්බර් 31 සිට වසර 10කි. ඕනෑම නව පෙනුමකින් ඇතිවන කාන්දු වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කොන්ත්‍රාත්කරුගේ වගකීමකි.

ප්‍රධාන පඩිපෙලෙහි ස්ථිර විදුරු ආවරණ වලින් හා සමහර ජනෙල් වලින් ජලය ගලා යාමක් තිබිණි.

ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් ප්‍රධාන පඩිපෙලෙහි ජනෙල් වටා සිලිකන් අමුද්‍රව්‍ය භාවිතා කර මුද්‍රා තැමෙන් නිවැරදි කරන ලදී. පසුගිය වසරෙහි දොර හැඩල් හා අගුල් නිවැරදි ලෙස භාවිතා නොකිරීම හේතුවෙන් ඒවා වැඩකරන තත්වයෙන් නොතිබෙන්නට හැකිය. නමුත් එය 2020 පෙබරවාරි 26 දින වන විට මෙහෙයුම් හා නඩත්තු අංශය විසින් දැනුම දෙන ලද අඩුපාඩු ලැයිස්තුවේ ලැයිස්තු ගත කර නොමැත.

කෙසේ වෙතත්, හැකි ඉක්මනින් එම අඩුපාඩු සඳහා යොමුවන ලෙසට කොන්ත්‍රාත්කරුට දන්වා ඇත.

**3.3. බාහිර ක්‍රියාකාරකම් /ව්‍යාපෘති අරමුණු වලින් බැහැර ගෙවීම්.**

| අනු අංක ------ | විගණන නිරීක්ෂණය ---------------------- | බලපෑම් ----------- | කළමනාකරණයේ අදහස් දැක්වීම ---------------------------------- | විගණකගේ නිර්දේශයන් ------------------------ |
|---|---|---|---|---|
| (අ) | වැඩසටහනේ ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව ව්‍යාපෘති වැඩසටහන 01 යටතේ බටහිර මධ්‍යම ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ ආදායම් නොවන ජලය අඩු කිරීමේ කණ්ඩායම සඳහා රු.මිලියන 62.90 කට මිලදී ගත් ක්රු කැබ් රථ 07ක් විය. කෙසේ වෙතත් රු.මිලියන 17.97ක වියදමින් ප්‍රසම්පාදනය කරන ලද ක්රු කැබ් රථ 02ක්, ව්‍යාපෘති වපසරියට අයත් නොවන සබරගමුව හා ඌව ප්‍රාදේශීය සහය සේවා මදාස්ථාන වෙත මාරු කර යවා ඇත.<br>එමෙන්ම එම ක්රු කැබ් රථ 2020 අගෝස්තු 31 දින වන විටත් බටහිර මධ්‍යම ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ ආදායම් නොලබන ජලය අඩු කිරීමේ කණ්ඩායමට පවරා ගෙන නොතිබුණි. | ව්‍යාපෘති සම්පත් බාහිර අරමුණු සඳහා යොදා ගෙන ඇත. | ව්‍යාපෘති ප්‍රසම්පාදන සැලැස්මේ මෙහෙයුම් හා නඩත්තු අංශය සඳහා වන වාහන ක්‍රියාකාරකම් යටතේ මෙම කාර්ය මණ්ඩල කැබ් රථ මිලදී ගෙන ඇත. ඒ අනුව ව්‍යාපෘතිය විසින්, ව්‍යාපෘති විෂය පථය තුල වාහන මෙහෙයුම් හා නඩත්තු බටහිර මධ්‍යම වෙත භාර දී ඇත. | ප්‍රසම්පාදනයේ සැබෑ අවශ්‍යතාවය හඳුනා ගැනීම අවශ්‍ය වන අතර අපේක්ෂිත අරමුණු සඳහා වත්කම් උපයෝජනය කල යුතු අවශ්‍යතාවයට අනුව ඒවා උපයෝජනය කල යුතු බවට අවධාරණය කෙරේ. |
| (ආ) | සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුලදී ව්යාපෘති කටයුතු වලට සහභාගි නොවූ ජල සම්පාදන අමාත්‍යාංශයේ සේවකයින් දෙදෙනෙකුට වැටුප් හා ඉන්ධන දීමනා ලෙස රුපියල් මිලියන 1.05ක් ගෙවීම් කර තිබුණි. | ව්‍යාපෘති අරමුදල් බාහිර අරමුණු සඳහා යොදා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස, අදාළ නොවූ වියදම් වලින් ව්‍යාපෘති පිරිවැය වැඩි වී ඇත. | මෙම ගෙවීම් සිදු කරනු ලැබුවේ ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස අමාත්‍යාංශය හා ක්‍රියාත්මක කරවීමේ ආයතනය ලෙස ජ.ස.ජ.ප්‍ර.ම. අතර සම්බන්ධීකරණ කටයුතු සැලකිල්ලට ගනිමින් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ඇතිවය. කෙසේ වෙතත් මෙම සේවාවන් වර්තමානයේදී අවසන් කර ඇත. | රේඛීය අමාත්‍යාංශයෙන් පිරිවැය ප්‍රතිපූරණය කිරීමට පියවර ගත යුතුය. |

**3.4. මත භේදයට තුඩු දෙන කරුණු**

| අනු අංක<br>--- | විගණන නිරීක්ෂණය<br>-------------------------- | බලපෑම්<br>-------- | කළමනාකරණයේ අදහස් දැක්වීම්<br>---------------------------------- | විගණකගේ නිර්දේශයන්<br>--------------------------- |
|---|---|---|---|---|
| (අ) | විසල් කොළඹ ප්‍රදේශයේ මහජනතාව දැනුවත් කිරීම හා මාධ්‍ය ප්‍රචාරණය සඳහා රු.මිලියන 81.44 ක් වටිනා කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබූ අතර 2019 දෙසැම්බර් 31 දින වන විට අදාළ ක්‍රියාකාරකම් සඳහා ඉන් රුපියල් මිලියන 31.15 ක මුදලක් වැයකර තිබුණි. කෙසේ වෙතත්, 2019 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘති 01 වැඩසටහනේ ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීමට ව්‍යාපෘතිය අපොහොසත් වී ඇත. මීට අමතරව ප්‍රජාවගේ ධාරිතා වර්ධනය සඳහා විසල් කොළඹ ප්‍රදේශයේ වැඩසටහන් - ව්‍යාපෘතිය 02 නමින් හැඳින්වෙන සමාන ව්‍යාපෘතිය මගින් ද රුපියල් මිලියන 65.03 ක මුදලක් වෙන් කර තිබූ අතර 2019 ඔක්තෝම්බර් 31 වන විට ඉන් රු.මිලියන 41.82 ක මුදලක් වැය කර තිබුණි.<br>කෙසේ වෙතත් විසල් කොළඹ ප්‍රදේශයේ මහජනතාව දැනුවත් කිරීම සහ ධාරිතාව ඉහල නැංවීම මත පමණක් සැලකිය යුතු අයගක් වෙන් කර ඇති අතර විගණනයේදී එය ගැටළුකාරී විය. | කොළඹ නගරයේ මහජනතාව දැනුවත් කිරීම සඳහා පමණක් සැලකිය යුතු ලෙස ව්‍යාපෘති අරමුදල් වෙන්කිරීම හා වියදම් කිරීම. | විසල් කොළඹ ජල හා අප ජල වැඩි දියුණු කිරීමේ අයෝජන වැඩ සටහන සාමාන්‍ය ගතානුගතික ව්‍යාපෘතියන් හා සැසඳීමේ දී විශේෂ මැදිහත් වීම සහිත ව්‍යාපෘතියකි.<br>නව ව්‍යාපෘති මගින් ප්‍රජාවට නව සේවා ලැබෙන බැවින් අදාල ප්‍රජාව විසින් ව්‍යාපෘති බෙහොදුරට සාදරයෙන් පිළිගන්නා නමුත් මෙම ව්‍යාපෘතිය බෙහොදුරට දැනටමත් ජල පහසුකම් ඇති ප්‍රජාව සමග කටයුතු කරන බැවින් ව්‍යාපෘතියට බෙහෝ බාධාවන්ට මුහුණ දීමට සිදු වේ.<br>මෙම ව්‍යාපෘතිය දිනකට පදිංචිකරුවන් 600,000 ක් සහ දිනකට මගින් 400,000 ඇතුළු මිලියනයක් පමණ ජනතාව සමග කටයුතු කරයි.<br>එමෙන්ම අඩු ආදායම් ලාභී ජනාවාසවල සිටින 100,000 පමණ ජනතාවකට ද ජල පහසුකම් සපයනු ලැබේ.<br>ප්‍රජාව අතර දැවැන්ත දැනුවත් භාවයක් ඇති කිරීමේ අව්‍යශතාවය සැලකිල්ලට ගෙන පීපීටිජ් විසින් ප්‍රජා බල මුදු ගැන්වීමේ සහ චර්යාත්මක වෙනසක් ඇති කිරීම, දැනුවත් කිරීම් ඇති කිරීම හා මාධ්‍ය වෙන් කිරීම සඳහා උපදේශකවරුන් වෙත පැවරීමට රාජ්‍ය නොවන සංවිධානයක් නිර්දේශ කර ඇත. | නල එලීමේ ක්‍රමය වෙනස් වූ නිසා, සමාන ව්‍යාපෘති 2 ක් විසින් සැලකිය යුතු මුදලක් වෙන්කර කොළඹ නගරය තුළ සිදු කරන මහජන දැනුවත් කිරීම සංශෝධනය කළ යුතුය. |

**3.5. පද්ධති හා පාලනයන්**

| අනු අංක | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|
| (අ) | 2017 පෙබරවාරි 15 වන දිනැති කළමණාකරණ විගණන දෙපාර්තමේන්තු අංක 01/2017 දරණ චක්‍රලේඛනයට අනුව අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට වැඩ සටහන් ව්‍යාපෘතිය - 01 පියවර ගෙන නොමැත. තවද, වැඩ සටහන් ක්‍රියාකාරකම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට භාජනය වී නොමැත. | ව්‍යාපෘතියේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතුවල දූර්වල පාලනය ව්‍යාපෘති කාර්ය සාධනයට අහිතකර ලෙස බලපෑ හැකිය. | අභ්‍යන්තර විගණන අංශයෙන් ප්‍රතිචාර ලබා ගැනීම කෙසේ වෙතත් පිළිතුරු ලැබී නොතිබුණි. | අභ්‍යන්තර විගණකවරයකු පත් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |